## ද මැසිනොද් විද්‍යාලය - කඳාන

## පළමු වාර පරීක්ෂණය

## කතෝලික ධර්මය - I

ශ්‍රේණිය - 11 2024 - 06

කාලය - පැය 1යි

සැලකිය යුතුයි: සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
අංක 1 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට (1) (2) (3) (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(1) පංච පුස්තකය සකස් වී ඇත්තේ,
1. ඉශ්‍රායෙල් ඉතිහාසය පදනම් කරගෙනය
2. පරම්පරාගත විශ්වාස සහ අත්දැකීම් පදනම් කරගෙනය
3. ඉශ්‍රායෙල් දේශයේ දිවැස්වරු පදනම් කරගෙනය
4. දෙවියන් වහන්සේගේ බලවත් ක්‍රියා පදනම් කරගෙනය

De Mazenod College Kandana
Learning Resource Center

(2) යාවේ සම්ප්‍රදායට අයත් කථා වන්නේ,
A. ආදම් සහ ඒව පාපයට වැටීම
B. මැවීම පිළිබඳ පළමු කථාව
C. නෝවා සමඟ ගිවිසුම
D. මැවීම පිළිබඳ දෙවන කථාව

ඉහත පිළිතුරු වලින් නිවැරදි පිළිතුරු වන්නේ,
1. A සහ B 2. B සහ C 3. A සහ D 4. C සහ D

(3) "ටෝරා" යන වචනයේ අර්ථය වන්නේ,
1. මෝසෙස්ගේ ව්‍යවස්ථාවලිය
2. නීතිය නැතහොත් ව්‍යවස්ථාවලිය
3. නීතිය නැතහොත් ඉගැන්වීම
4. ව්‍යවස්ථාව නැතහොත් ඉගැන්වීම

| | | | |
|---|---|---|---|
| .................... | .................... | .................... | .................... |
| E | P | D | J |

(4) ඉහත හිස්තැන්වලට අයත් දේවධාර්මික සම්ප්‍රදායන් වන්නේ,
1. එලෝහිම් සම්ප්‍රදාය, පූජක සම්ප්‍රදාය, ද්විතීය නීති සම්ප්‍රදාය, යාවේ සම්ප්‍රදාය
2. ද්විතීය නීති සම්ප්‍රදාය, එලෝහිම් සම්ප්‍රදාය, යාවේ සම්ප්‍රදාය, පූජක සම්ප්‍රදාය
3. එලෝහිම් සම්ප්‍රදාය, ද්විතීය නීති සම්ප්‍රදාය, පූජක සම්ප්‍රදාය, යාවේ සම්ප්‍රදාය
4. ද්විතීය නීති සම්ප්‍රදාය, පූජක සම්ප්‍රදාය, යාවේ සම්ප්‍රදාය, එලෝහිම් සම්ප්‍රදාය

(5) දෙවියන් වහන්සේ එදිනෙදා ජීවිතයේදී විවිධ මාර්ගවලින් අපට කථා කරන බව පවසන සම්ප්‍රදාය වන්නේ,

1. පූජක සම්ප්‍රදාය 2. ද්විතීය නීති සම්ප්‍රදාය 3. එලෝහිම් සම්ප්‍රදාය 4. යාවේ සම්ප්‍රදාය

(6) දේව වචනය පරම්පරාවෙන් පරම්පරාවට දායාද කරන ලද්දේ,

1. ලේඛන සම්ප්‍රදාය තුළිනි 2. පූජක සම්ප්‍රදාය තුළිනි

3. වාචික සම්ප්‍රදාය තුළිනි 4. ජීවන හා සම්ප්‍රදාය තුළිනි

(7) පුරාණ ගිවිසුමට අයත් ජනප්‍රිය ඓතිහාසික කෘති දෙක වනුයේ,

1. රූත් කථාව සහ එස්තර් කථාව 2. නෙහෙමියා කථාව සහ එස්තර් කථාව

3. ජෝබ් කථාව සහ තෝබිත් කථාව 4. රූත් කථාව සහ එස්රා කථාව

(8) හෙබ්‍රෙව් බයිබලයේ සහ ක්‍රිස්තියානි බයිබලයේ පොත් ගණන වන්නේ,

1. 27/66 කි 2. 39/66 කි 3. 46/27 කි 4. 39/73 කි

(9) නව ගිවිසුමේ කතුවරුන් තමන්ගේ ග්‍රන්ථ ලේඛන ගත කිරිමේ දී බොහෝ විට භාවිතා කර ඇත්තේ .................. ය. හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,

1. හෙබ්‍රෙව් පිටපත 2. මැසොරොටික් පිටපත 3. ඇරමයික් පිටපත 4. ග්‍රීක පිටපත්

(10) ලූක් සුභාරංචියේ දෙවන කාණ්ඩය ලෙස හඳුන්වනු ලබන පොත වන්නේ,

1. එළිදරව් පොත 2. දානියෙල් පොත

3. නෙහෙමියා පොත 4. අපෝස්තළුවරුන්ගේ ක්‍රියා පොත

A. ධර්මදූත සේවයට සූදානම B. සිරියාවේ සාක්ෂි දැරීම

C. ජෙරුසලමෙහි සාක්ෂි දැරීම D. පේදුරු තුමාගේ ධර්මදූත සේවය

(11) ඉහත කරුණු අතරින් අපෝස්තළුවරුන්ගේ ක්‍රියා පොතෙහි සැකැස්ම පිළිබඳ වඩාත්ම නිවැරදි පිළිතුර වන්නේ,

1. A සහ C 2. B, C සහ D 3. A, B සහ C 4. B සහ D

(12) දිවැසිවරුන් "නබී" යන වචනයෙන් හඳුන්වනු ලැබූ අකර එහි තේරුම වනුයේ,

1. "කෙනෙකු වෙනුවෙන් කථා කරන තැනැත්තා"

2. "දේව පණිවුඩය අන් අයට ප්‍රකාශ කරන තැනැත්තා"

3. "දේව වචනය අන් අයට තේරුම් කරන තැනැත්තා"

4. "දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරන තැනැත්තා"

(13) "නුඹේ උපතට පෙර නුඹ කැප කෙළෙමි. ජාතීන් හට දිවැසිවරයෙකු ලෙස මම නුඹ පත් කෙළෙමි"
මෙය කා විසින් කා හට කියන ලද්දක් ද?

1. දෙවියන් වහන්සේ විසින් මෝසෙස් තුමාට
2. දෙවියන් වහන්සේ විසින් ආබ්‍රහම් තුමාට
3. දෙවියන් වහන්සේ විසින් ජෙරමියා දිවැසිවරයාට
4. දෙවියන් වහන්සේ විසින් එසෙකියෙල් දිවැසිවරයාට

(14) ප්‍රධාන දිවැසිවරු හා සුළු දිවැසිවරු වර්ගීකරණයේ පදනම වන්නේ,

1. එක් එක් දිවැසිවරයාගේ පරිණත බව අනුව
2. එක් එක් දිවැසිවරයාගේ අධ්‍යාපන මට්ටම අනුව
3. එක් එක් දිවැසිවරයාගේ උගත්කම අනුව
4. එක් එක් දිවැසිවර ග්‍රන්ථයේ විශාලත්වය අනුව

(15) සෙරාප්වරයෙකු විසින් ගිනි අඟුරකින් ........................ තොල් පවිත්‍ර කෙරිනි. හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,

1. යෙසායා දිවැසිවරයාගේ
2. එසකියෙල් දිවැසිවරයාගේ
3. ජෙරමියා දිවැසිවරයාගේ
4. ආමොස් දිවැසිවරයාගේ

(16) පාස්කු මංගල්‍යය සඳහා ජුදෙව්වන් ගියේ,

1. නාසරතයට 2. ගලීලයට 3. සිනගෝගයට 4. ජෙරුසලෙම් දේව මාලිගාවට

(17) සන්තියාගෝ මුනිතුමාගේ හිස ගසා මරා දමනු ලැබුවේ කවුරුන් යටතේ ද?

1. හෙරෝද් ඇන්ටිපස්
2. පිලාත් ආණ්ඩුකාරවරයා
3. හෙරෝද් (අග්‍රිපා)
4. පාරාවෝ රජ

(18) ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා රචිත පොත් දෙක වන්නේ,

1. පසන් පොත/ වේද කාව්‍යය
2. උත්පත්ති/ වේද කාව්‍යය
3. ප්‍රසාද නිධාන ජීවිතය/ දේව පණත්
4. පසන් පොත/ ලෙවී ව්‍යවස්ථාව

(19) අපෝස්තළුවරුන්ගේ ක්‍රියා පොතට අනුව ශු. පාවුළු තුමාට ප්‍රසාද ස්නාපනය දානය කළේ,

1. ස්තේපන් තුමාය 2. පේදුරු තුමාය 3. අනනියස් තුමාය 4. ශුද්ධෝත්තම පියතුමාය

(20) උත්පත්ති පොතේ සර්පයාව සංකේතවත් කරනුයේ,

1. මිනිසා කෙරෙහි සාතන්ගේ බලය පෙන්වීමටය.
2. මිනිසා තුළ ඇති අකීකරු කම දැක්වීමටය.
3. මිනිසා තුළ ඇති රුචිය පෙන්වීමටය.
4. මිනිසාගේ සතුරෙකු ලෙස දැක්වීමටය.

Dr Mazenod College Kandana Learning Resource Center

(21) දෙවියන් වහන්සේ සහ නෝවා අතර ඇති කරගත් ගිවිසුමේ බාහිර සලකුණ වනුයේ,

1. චර්මඡේදනය 2. ඝන වලාකුළ 3. තද වර්ෂාව 4. දේදුන්න

(22) "එම්බා පොළොං වංශය එන්නට තිබෙන උදහසින් පලා යන්නට තුඹලාට අවවාද කළේ කවරෙක්ද? යනුවෙන් ස්නාවක ජොහාන් තුමා චෝදනා කළේ

1. පරිසිවරුන්ට 2. හේවායන්ට 3. සාමාන්‍ය ජනතාවට 4. ප්‍රභූවරුන්ට

(23) ශුද්ධ බයිබලයේ ග්‍රීක් බසින් ලියන ලද පිටපත හඳුන්වනු ලබන්නේ,

1. ඇරමයික් 2. ප්‍රොතෙවෙස් 3. මැසොරෙටික් 4. සෙප්ටුවාජින්ත

(24) "ප්‍රාතිහාර්යයන් යනු ස්වභාව ධර්මය තුළ අප දන්නා සත්‍යතාවයන්ට පටහැනිව සිදුවන ක්‍රියාවක්" බවට ප්‍රකාශ කල සභා පියතුමා

1. ශු. ක්ලෙමන්ට් 2. ශු. අම්බ්‍රෝස් 3. ශු. ජෙරොම් 4. ශු. අගුස්තීනු

(25) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳව පූර්ව සළකුණක් වන්නේ,

1. මෙල්කිසදෙක්ගේ යාගය
2. කල්වාරි යාගය
3. ඊසාක්ගේ යාගය
4. එලියාගේ යාගය

(26) පුරාණ ගිවිසුමේ වන්දනාවේ කේන්ද්‍රීය ක්‍රියාව වන්නේ,

1. චර්මඡේදනය 2. දසයෙන් කොටස දීම 3.යාග පූජා පුද කිරීම 4. සිනගෝගයේ එක් රැස් වීම

(27) ප්‍රේමය සහ සේවය අතපසු කරමින් දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට සහභාගී වීම නුසුදුසු බව ශුද්ධවූ පාවුළු තුමා අනුශාසනා කරන්නේ

1. කොරන්ති සභාවට 2. රෝම සභාවට 3. ගලාති සභාවට 4. පිලෙමොන්ටය

(28) "මරියතුමියගේ ශ්‍රී හර්දයේ හමුදාව" යන සංවිධානය ආරම්භ කළේ

1. ගරු මයිකල් රුද්‍රිගු පියතුමා
2. ශුද්ධවූ තෙරේසා මිනිතුමිය
3.ශුද්ධවූ අන්තෝනි මුනිතුමා
4. ශුද්ධවූ මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා

(29) දේව ප්‍රේමයට විරුද්ධ පාපයක් වන්නේ,

1. වෙනත් දෙවි දේවතාවන්ට බාර වීම
2. උඩඟුවෙන් දෙවියන් වහන්සේව ප්‍රතික්ෂේප කිරීම
3. දේව මැවිලි දේවත්වයෙන් පිදීම
4. එදිනෙදා සිදුවීම්වලදී දෙවියන්ට දොස් කීම

(30) ඉරුදින ශුද්ධවත් ලෙස ගතකිරීම සඳහා අප විසින් කළයුතු පළමු ණය යුතුකම වන්නේ,

1. ශුද්ධ ලියවිල්ල කියවීම
2. රෝගීන් බලන්නට යාම
3. දිව්‍ය පූජාවට සහභාගී වීම
4. දහම් පාසලට යාම

(31) අනනියස් සහ සපීරාගේ කථාවෙන් අපට ගත හැකි පාඩම වන්නේ,
   1. ඉඩම විකිණූ මුදලින් භාගයක් දිළිඳුන්ට දිය යුතු බවයි
   2. සත්‍යාගරුකව ජීවත් විය යුතු බවයි
   3. දේපල පොදුවේ තබා ගත යුතු බවයි
   4. ඉඩම විකිණූ මුදල් ප්‍රේරිතයන්ට දිය යුතු බවයි.

(32) ගුරුවරුන්ට, වැඩිහිටියන්ට අකීකරු වීම හා සිත්රිදවීමෙන් කඩකරනු ලබන දේව පණත වන්නේ,
   1. 4 වන පණත   2. 5 වන පණත   3. 6 වන පණත   4. 7 වන පණත

(33) "මරණයට පත් වූවත්, මම මගේ දේව ජීවිතය නැති කර නොගනිමි." කියා ජේසුට දුන් පොරොන්දුව ඉටුකළ ශුද්ධවන්තිය
   1. ශුද්ධවූ තෙරේසා   2. ශුද්ධවූ මොනිකා
   3. ශුද්ධවූ සිසිලියා   4. ශුද්ධවූ මරියා ගොරෙත්ති

(34) ආගමන සමය තුළ සමරන වැදගත් මංගල්‍යයක් වන්නේ,
   1. ශුද්ධවූ පවුලේ මංගල්‍යය   2. ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍යය
   3. ශුද්ධවූ ත්‍රිත්වයේ මංගල්‍යයේ   4. මරියතුමියගේ නිර්දෝෂ පිළිසිඳීමේ මංගල්‍යය

(35) දිව්‍ය පූජාවේ ප්‍රධානතම යාච්ඤාව වන්නේ,
   1. ස්තොත්‍ර යාගික යැදුම   2. යාම යැදුම   3. විශ්වාසකයින්ගේ යැදුම   4. ආරම්භක යැදුම

(36) ජේසුස් වහන්සේගේ වචන හා ක්‍රියාවන්ගේ හරය වූයේ,
   1. දේව කැමැත්තට නතුවීමයි   2. දේව පාලනයට නතුවීමයි
   3. දේව රාජ්‍යය ගොඩ නැගීමයි   4. දේව රාජ්‍යයේ උදාවයි

(37) උත්තම පූජක යාච්ඤාව පුරා දිවයන එක් ප්‍රධාන තේමාවක් වන්නේ,
   1. එකමුතුකමයි   2. බැහැපත්කමයි   3. ඉවසිලිවන්තකමයි   4. දයාව හා කරුණාවයි

(38) ක්‍රිස්තුස් වහන්සේ තමන් දේව පුත්‍රයාණන් බව පැවසූ එකම අවස්ථාව වන්නේ,
   1. ස්වාමිවාක් ආරාධනාව   2. උත්තම පූජක යාච්ඤාව
   3. කන්ද උඩ දේශනාව   4. මල් උයනේ යාච්ඤාව

(39) ජේසුස් වහන්සේගේ මෘත ශරීරය හා, භූමදාන සිදු කිරීමට ඉදිරිපත් වූයේ,
   1. මරිය තුමිය   2. පේදුරු තුමාය   3.මග්දලාහි මරියා   4. අරමාතියේ ජෝසෙප්

(40) රෝමයේ නීරෝ අධිරාජයාගේ පීඩන සමයේදී (ක්‍රි.ව.68) හිස ගසා මරා දමනු ලැබුවේ,
   1. ශු. පාවුළු තුමාගේ   2. ශු. සෙබස්තියන් තුමාගේ
   3. ශු. පේදුරු තුමාගේ   4. ශු. ස්තේපන් තුමාගේ

## ද මැසිනොද් විද්‍යාලය - කඳාන

## පළමු වාර පරීක්ෂණය

## කතෝලික ධර්මය - II

ශ්‍රේණිය - 11 කාලය - පැය 2යි

පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.

01. 1. දේශක දිවැසිවරුන්ගේ වචන සහ ක්‍රියා සඳහන් වන පුරාණ ගිවිසුමේ ග්‍රන්ථ දෙක ලියන්න.

2. පුරාණ ගිවිසුමේ ජනවන්දනාවට අදාළ නීති නියෝග සහ ඉශ්‍රායෙල් ජනතාව ගැන සඳහන් වන පොත් දෙක ලියන්න.

3. මතෙව් ශුභාරංචියේ පරමාර්ථ දෙක ලියන්න.

4. ඉශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය මර්දනය කිරීමට මිසර රජතුමා ගත් පියවර දෙකක් ලියන්න.

5. දෙවියන් වහන්සේ නෝවා සමඟ ඇති කරගත් ගිවිසුමේ පොරොන්දුව ලියන්න.

6. මිනිසාගේ උතුම්කම විද්‍යාමාන වන කරුණු දෙකක් ලියන්න.

7. බබිලෝනියානු විප්‍රවාසයෙන් පසු යුදා ජාතියේ සමාජීය සහ ආගමික ප්‍රතිස්ථාපනය පිළිබඳ මූලික කරුණු ඇතුළත් ග්‍රන්ථ දෙක ලියන්න.

8. ශු. පාවුළු තුමා ලිපි ලිවීමේ පරමාර්ථ දෙක ලියන්න.

9. හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද දෙක ලියන්න.

10. පේදුරු තුමාගේ ප්‍රථම දේශනයේ අඩංගු කරුණු දෙක ලියන්න.

02. 1. ද්විතීය සම්මත ග්‍රන්ථ 4ක් ලියන්න.

2. ද්විතීය සම්මත ග්‍රන්ථ දේවානුභාවයෙන් ලියවී ඇති බවට සාක්ෂි 3ක් ලියන්න.

3. නූතන තාක්ෂණ හේතුවෙන් ලෝකය තුල තරුණ පරපුර දේව වචනයෙන් දුරස් වී ඇත. එලෙස දුරස් වූ තරුණ පරපුර වෙත දේව වචනය ලඟා කරණ අකාර 5ක් ලියා විස්තර කරන්න.

03. 1. අධ්‍යාත්මික ශුභාරංචිය යනුවෙන් හඳුන්වනු ලබන්නේ කුමන සුභාරංචියද?

2. ඔබ සඳහන් කල ශුභාරංචිය හා කතෘ පිළිබඳ වාක්‍ය තුනක් ලියන්න.

3. ඔබගේ ජීවිතය ශුභාරංචියක් කරගෙන අන් අයගේ ජීවිත වලට ප්‍රීතිය, සතුට සහ සැනසීම දීමට ඔබට කල හැකි ක්‍රියා 5ක් ලියා විස්තර කරන්න.

2024.06 G.11

04. 1. පෙන්තකොස්ත මංගල්‍යයෙදී ප්‍රෙදෙව්වෝ සිදු කරන්නේ කුමක්ද?

2. ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ ශ්‍රාවකයන් තුළ ඇති වූ වෙනස්කම් 3ක් ලියන්න.

3. අභිෂේකයි ආලේපය ශුද්ධාත්ම බලය ලැබූ ඔබ විශ්වාසය වෙනුවෙන් සාක්ෂි දැරූ අවස්ථාවක් ලියා ලියා විස්තර කරන්න.

05. 1. දෙවියන් වහන්සේ දින හයක් තුළ ලෝකය මවා සත්වන දින නිවාඩු ගැනීමෙන් අර්ථවත් වන්නේ කුමක්ද?

2. මැවීමේ දෙවන කථාවෙහි මිනිසා මැවීම පිළිබඳ වාක්‍ය 3ක් ලියන්න.

3. මිනිසාගේ උතුම්කම රැකගැනීම ඔබ කළ යුතු කාර්යයන් 5ක් ලියා විස්තර කරන්න.

06. 1. දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ ඇති කරගත් ගිවිසුමේ ප්‍රධාන කරුණු 2ක් ලියන්න.

2. නික්මයාම 20: 1-17 ට අනුව පළමු පණත් තුන ලියා දක්වන්න.

3. ඔබ ප්‍රසාද ස්නාපන පොරොන්දු විශ්වාසවන්තව ඉටු කරන ආකාර 5ක් ලියා විස්තර කරන්න.

07. 1. පහත සඳහන් මාතෘකා දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

I. ශු. පාවුළු තුමාගේ ධර්මදූත සේවය

II. පංච පුස්තකයෙහි ඇති වැදගත්කම

III. එසකියෙල් දිවැසිවරයාගේ කැඳවීම

IV. ඉශ්‍රායෙල් ජනතාව නික්මයාම ගමන තුළ දිව්‍ය සංරක්ෂණය අත්දුටු ආකාරය